

යින් කීප දෙනෙකුට අවස්ථාව සලසමින් නිවේදකයින් සිංහල, ඉංග්‍රීසි බසින් ප්‍රකාශ කල අතර, පිළිගැනීම 2013 වසරේ සභාපති ධූරය දැරූ දයා බමුණුසිංහ මහතා සිංහල හා ඉංග්‍රීසි බසින් හරබර දෙසුමකින් උත්සව සභාව ප්‍රබෝධමත් කිරීමට සමත් විය. 2019 වසරේ සභාපති චන්දන ඉඹුලාන මහතා එම කාර්යය ඉටුකර ඇත. ඔහු කථාකරමින් ළමා තරුණ කෙටි කාලීන පදිංචි කරුවන්, සංචාරක අමුත්තන් (දෙමාපියන්) ප්‍රබෝධමත් කරමින් උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුබ සාධක සංගමයේ ආරම්භය හා අද තත්වය පැහැදිලි කිරීමට සමත් වී ඇත. 2005 වර්ෂයේ සංගමය ආරම්භව විවිධ සමාජසේවා කටයුතුවල නිරතව ඉටුකළ සමාජ සත්කාරය සිහිපත් කර ඇත.



ක්‍රමක්‍රමයෙන් සංගමයේ අගය වටහා ගත් සමාජ සේවා සංවිධාන සිංහල වෙළඳ ප්‍රජාව, හියුම් නගර සභාව වැනි සංගමයේ සංගමයේ දියුණුවට අත හිත දුන් පිරිස අතරින් යෝජිත අවුරුදු සංස්කෘතික මංගල්‍යය "සූර්‍ය උදානය" මැයින් අප්‍රේල් මාසයේ පැවැත්වීමට ගත් සිථිරත්වය 2011 වර්ෂයේ පළමු වරට පැවැත්වීමට හැකි වූ බව පෙන්වා දී ඇත. ඉන්පසු ලත් විශාල ජයග්‍රහණය ඇසුරෙන් අද 9 වැනි වරටත් අති විශාල ජනගහනයක් මධ්‍යයේ මෙම සංස්කෘතික මංගල්‍යය පැවැත්වීමට හැකි වීම ගැන සංගමයේ සතුට සභාපති තුමා ප්‍රකාශ කරද්දී උත්සව සභාවෙන් හඬ නැගූ ගිගුම් අත්පොලසන් නාදය එම අදහස අනුමත කළාසේ ඉටුවී ඇති බව දැන ගැනීමට ලැබීම සතුටට කරුණකි. සාරවත් හරබර කථාව සිංහල භාෂාවෙන්ද ඒ සමඟම කෙටියෙන් ඉංග්‍රීසි බසින් ද පවත්වා උත්සව සභාව ඔපවත් කර ඇති බව දැනගත්තා. ශ්‍රී ලංකා කොන්සල්වරයා (W. G. S Prassana) කථා කරමින් ලංකාවේ ආවේණික සිරිත් විරිත් චාරිත්‍ර සිංහල දරුවන්ට පුහුණුවත් අගයත් දැන ගැනීමට වෙහෙසෙන ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගේ උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුබසාධක සංගමයේ නිලධාරීන් ඇතුළු සාමාජික සැමට තුති පුද කල බවත් හියුම් නගර සභාවේ සභාපති (Cr. Carly Moore) කථා කරමින් ශ්‍රී ලාංකික ජනතාව තම මව් රට අමතක නොකර මෙවැනි සංවිධානාත්මක උත්සව පැවැත්වීම අගය කරන බවත්, හියුම් නගර සභාවෙන් ඉටු විය යුතු අවශ්‍ය ඕනෑම උපකාරයක් ලබා දෙන බව ඉංග්‍රීසි බසින් ප්‍රකාශ කර ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රිනි (Maria Vamakinou Member of Parliament - MP) ඉංග්‍රීසි බසින් කථා කරමින් සිංහල ප්‍රජාවගේ එකමුතුව ඔවුන්ගේ සංස්කෘතික විශේෂ අවුරුදු මංගල්‍යය මේ අයුරින් උසස් ලෙස වර්ෂයක් පාසා පැවැත්වීම අගය කරමින් අනාගතයේ දී සංගමයේ දියුණුවට ඇගේ පූර්ණ සහයෝගය ලබා දෙන බවට ප්‍රකාශ කර තිබීම අගනේය. හියුම් නගර සභා නියෙර්ජ්‍ය සභාපති ( Deputy Mayor Home city council Cr. Naim Kuri) ඉංග්‍රීසි බසින් කථා කරමින් මෙම ක්‍රීඩා පිටිය සිංහල සංස්කෘතික සූර්ය උදාන මංගල්‍යයට නොමිලේ ලබාදීමට තමා ඇප කැපව කටයුතු කරන බවත්, නැටුම් ගැයුම් සහිත ලක්බිමේ ආවේණික ක්‍රීඩා මෙහි වෙසෙන සිංහල දරුවන්ට දැක බලා ගැනීමට



හා එම ක්‍රීඩාවන්හි නියැලීමට සැලසීම උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුබසාධක සංගමයේ නිලධාරීන් ඇතුළු සැමට තුති පුද කිරීම අගය කල යුක්තකි. අනතුරුව සෙසු කථිකයන්ගෙන් ද උත්සව සභාව වර්ණවත් වී ඇති අතර සිංහල බසින් හා ඉංග්‍රීසි බසින් අප ලාංකික දූ පුතුන්ගේ කථා මෙවරද ඉටුවීම අගය කළ යුතුය. ලේකම් උපුල් චන්දන මහතාගේ ස්තූති කථාව තුළින් සංගමයේ දියුණුවට අත හිත දෙන සියලුම සිංහල ප්‍රජාවටත්, සෙසු ආයතන හා පෞද්ගලිකව උදව් කරමින් මෙම සූර්ය උදානය උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට හැකි වීම ලක්වැසියන්ගේ ද ගෞරවයට ලක් වී ඇති බව පැහැදිලි කිරීමෙන් ද විශේෂයෙන් මේ අවස්ථාව වන විට භාරදහසකට පන්දහසකට ආසන්න පිරිසක් එක් රැස්ව සිටින බව ලේකම් මහතාට දැකීමට හැකි බව පවසා ඒ සියලු දෙනාටම අඩු පාඩුවක් නොවන පරිදි උදය අවුරුදු මේසය කිරිබත්, කැවුම්, අතිරස, කේක්, කෙසෙල් ගෙඩි වලින් සමන්විත අලංකාර කෑම මේසයක් පිළියෙල කර ගැනීමට සහාය දුන් සැමට තමාගේත් සංගමයේත් ප්‍රණාමය පුද කර ඇත. එසේම මෙම උත්සවය උදයේ සිට සවස් වන තුරු පවත්වාගෙන යාමට හැකි පරිදි දහවල් ආහාර, තේ කිරි කෝපි, පලතුරු යුෂ වලින් ද සැමට අවශ්‍ය තරම් භුක්ති විඳීමට සලසා ඇති බව මහත් අභිමානයෙන් යුතුව ප්‍රකාශ කර විශේෂිත ආරාධිත අමුත්තන්ට එම උදය ආහාර මේසයේ රස බැලීමට ගෞරවනීය ආරාධනාව එදා මෙන් මෙවරද ඉටු කිරීම වැදගත්ය. 2013 වසරේ එම අවස්ථාවට මටද සහභාගී වීමට ලැබුණා. එම අවස්ථාවේ දී එදා මට හැඟුණේ ලංකාවේ කොතරම් අවුරුදු උත්සව පැවැත්වුවත් මේ තරම් කෑම බීමෙන් යුතුව පැමිණ සිටින පිරිසට සංග්‍රහයක් කිසිදු අවුරුදු උත්සවයක දක්නට නොමැති බවයි. එසේම ඒ සම්බන්ධව එදා මගේ සිතට නැගුනේ කනගාටුවක් ය. 2013 වසරේ උදය අවුරුදු මේසයේ රස බැලූ මා අවට දර්ශන දැකීමෙන් ඉමහත් සතුටට පත් විය. බාල, තරුණ, මහළු ජාතීන්, උස් පහත් බේද දුරලමින් සැවොම එක්සිත්ව ඉතාම සංවරශීලීව කෑම මේසය වටා යමින් රසකැවිලි වල රස භුක්ති විඳි අයුරුය. මෙවර එදාට වැඩි පිරිසක් එම අවස්ථාවට සහභාගී වී ඇති බව මා සමඟ ඇමතුවේ බලවත් සතුටු සිතින්ය.

ළමා, තරුණ විශාල පිරිසක් ඉමහත් සතුටින් බලාපොරොත්තුව සිටි ක්‍රීඩා තරඟ ආරම්භ කිරීමේ නිවේදනය නිවේදකයින් ප්‍රකාශ කරත්ම ඇති වූ ප්‍රීති ඝෝෂාවෙන් මා ඉමහත් සතුටට පත්විය. විශාල ක්‍රීඩා පිටිය එකවර තැන් තැන් වල ක්‍රීඩා තරඟ සංවිධායක මඩුල්ල විනිසුරුවන් මඟින් පැවැත්වෙන බව සිංහල, ඉංග්‍රීසි බසින් නිවේදකයන් ප්‍රකාශ කරත්ම දුර දිවීම, ළමා තරුණ ගෝනි රේස්, තුන් පා දිවීම, අලියාට ඇස තැබීම. විකට ඇඳුම් තරඟ ඇති ස්ථානවලට දිවගිය ළමා තරුණ පිරිස් එම තරඟ සඳහා සහභාගීව දිනුම පැරදුම සිනාමුසු මුහුණින් භාරගෙන තරඟවලට සහභාගී වීමේ උද්යෝගය දුටු මට සිතුනේ අප සිංහල දරුවන් කොතරම් කැමැත්තක් දක්වනවාද අවුරුදු උත්සවය වෙනුවෙන් යන්නයි. එසේම සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද සැමරීමේ අගය ළමා, තරුණ, පරපුර කොතරම් දුරට වටහාගෙන තිබෙනවාද යන්න මගේ සිතට හැඟුණි. කාන්තා වැඩිහිටියන් හතර දෙනා හය දෙනා බැගින් වාඩි වී ගැසූ රබන් පද සුරල් ක්‍රීඩා පිටියේ දෝන්කාරයෙන් හඬ නැගූ රසය සුදු ජාතිකයින් කීප දෙනෙකු යුහු සුළුව එම ස්ථානයට පැමිණ සතුටින් ඡායා රූප ගනිමින් මහත් ඕනෑකමින් එම රබන් වාදනයට සමගාමී රබාන වටා තවත් කාන්තාවන්ගේ රංගනය බොහෝදුරට රස වින්දේ සුදු ජාතික සමාජයේ මෙවැනි වාදන දක්නට නැති නිසාම විය හැක. තරුණ දරුවන් හා කාන්තාවන් අතර පොල් ගෑමේ තරඟය පිරිමි ගැහැණු කොට්ට පොර ගැසීම, හිස් බෝතලයට අතින් අත යවා වතුර පිරවීම, ගැහැණු පිරිමි කණාමුට්ටි බිඳීම, අත්පන්දු (Vollyball) දැල් පන්දු (Net Ball) කඹ ඇදීම, ඉදිකටුවට නූල දැමීම, දුර සිට දමන බිත්තර ඇල්ලීම වැනි ලක්බිමේ ජාතික හා සංස්කෘතික ක්‍රීඩා තරඟ තිහකට අධික ප්‍රමාණයක් දවස පුරා පවත්වා ඇති බව දැනගත්තා. මේ සෑම තරඟ ඉසව්වක් අවසානයේ පළමුවැනියා, දෙවැනියා, තුන්වැනියා, දක්වන කුඩා වේදිකාවට ජයග්‍රාහකයින් ඒ මොහොතේම කැඳවා ඉතා වටිනා තෑගි රැ



ස්ව සිටින අමුත්තන් අතින් පිරිනැමීම තරඟ වලට ඉදිරිපත් වන්නන් උනන්දු කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙසයි මට හැඟුණේ. එම කාර්යය මෙවරද එලෙසම ඉටු වී ඇති බව දැනගත්තා. අවුරුදු කුමාරිය තේරීමේ තරඟයට යුවතියන් යුහුසුළුව කණ කර ආභරණ වලින් සැරසී වේදිකාව මත විනිසුරුවන් ඉදිරියට පැමිණීම නරඹන්නන්ගේ ඉමහත් සතුට සැමගේ මුහුණු වලින් දක්නට ලැබුණි. ලංකා කාන්තා ඇඳුම් අතර සාරිය, ඔසරිය වැනි ඇඳුම් වලින් සැරසී ඉදිරිපත් වීම විදෙස් රටක ද මා සිටින්නේ වැනි හැඟීම් පහල වූයේ යෞවනියන්ගේ විවිධ විලාසිතාවන් ඉදිරිපත් කිරීමේ අගය දැකීමෙන්ය. ඉහත පැවති සියළු තරඟ ඉසව් මෙවරද නොඅඩුව පවත්වා ජයග්‍රාහක සැමට වටිනා ත්‍යාග පිරිනැමීම සිදු කිරීම සංගමයේ එක් අංගයකි. මේ වසරේදී ද එම කාර්යය ඉටුකිරීම ඇත්තෙන්ම අගය කල යුතුය. දවල් කාලය කා හටත් නොදැනීම ගෙවියත්ම තරුණ දරුදැරියන්ගේ රසබර සිංහල හින්දු ඉංග්‍රීසි සංගීතයෙන් ගායනයෙන් වාදනයෙන් ඉදිරිපත් කළ රංගනයන් සවස් කාලය වන විට එක් රැස් වූ මේ වර්ෂයේ හයදාහක හත්දාහක විශාල පිරිසකගේ සිත් ඉපිලව යමින් රංගනයේ දී, ගායනයේ දී පැවති මිහිරියාවට යොමුව බාල තරුණ වැඩිහිටි වැඩි පිරිසක් ක්‍රීඩා පිටියේ නැටුම් විලාසයන් දක්වමින් අතිමහත් ප්‍රීතිය ගෙන හැර පෑ බව සංගමයේ සැමගේ ද මහත් සතුට ආඩම්බරයයෙන් ප්‍රකාශ කිරීමට යෙදුණා.

මෙවැනි සංස්කෘතික උත්සවයන් පැවැත්වීට ඉඩ කඩ සලසමින් සහයෝගය දක්වන ඕස්ට්‍රේලියානු සුදු ජාතිකයින්ට ප්‍රශංසා කිරීම වැදගත්ය. වෙනස් විදේශීය රටක ජාතිකයින් තුළින් විශේෂයෙන් ශ්‍රී ලාංකිකයින්ට එම අවස්ථාව සැලසී තිබීම එදා මගේ සිතට මහත් අස්වැසිල්ලක් වූවා. උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුහ සාධක සංගමයේ නිලදරුවන් වර්ෂයකට වරක් වෙනස් වුවත් නොවූවත් ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තු මැති



ඇමති වරුන්ගේ, හියුම් නගර සභා සභාපති ඇතුළු සෙසු මන්ත්‍රීවරුන්ගේ ශ්‍රී ලංකා ජනරාල්වරයාගේ විශේෂයෙන් සිංහල වෙළඳ ප්‍රජාව, වෙනත් ස්වේච්ඡා සංවිධාන වල ආධාර උපකාර සහයෝගය ලබා ගැනීමේ හැකියාව ධෛර්යය ලැබේවා ! ඒ මාගේ අභිමතාර්ථයයි. ප්‍රාර්ථනාවයි. එසේම 2020 වර්ෂයේ සිංහල ලාංකික බෞද්ධ ක්‍රිස්තියානි වැනි සියලුම ජාතිකයින් තම තමන්ගේ දේශපාලන ජාතිබේද නොතකා එකාමෙන් එක්ව දූ දරුවන් සමඟ එක්රැස්ව ඉමහත් උත්කර්ෂවත් සිංහල සහ හින්දු සංස්කෘතික මංගල්‍යය "සූර්ය උදානය" මැයින් උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුහ සාධක සංගමයට පැවැත්වීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි. එසේම ඉත සිතින් ශුභ පතමින් සියලුම ක්‍රියාකාරී නිලදරුවන්ට, සාමාජික සැමට මගේ හද පත්ලෙන්ම පැන නඟින ස්තූතිය පුද කරමි.

එදා සිට අද දක්වාම වර්ෂයෙන් වර්ෂයට වෙනස් වූ නිලධාරී මණ්ඩලය තම ජාතික අභිමානය රැක ගැනීමේ අරමුණින් කැඩී බිඳී දුර්වල නොවී ශක්තිමත්ව දේශපාලන, ජාතිභේද වලින් තොරව පවත්වාගෙන ඒම සිංහල වර්තමාන දූ දරුවන්ගේ වාසනාවකි. අනාගතයටද උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුහ සාධක සංගමය රැක ගැනීම වැඩිහිටි පිරිස සමඟින් තරුණ පිරිසගේ වගකීමයි. තවද වර්තමාන නිලධාරි මණ්ඩලයේ සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික, ප්‍රධාන සංවිධායක, උපදේශක, ක්‍රීඩා සම්බන්ධීකරණ නිලධාරී ඇතුළු සියලුම කමිටු නිලධාරීන් උතුරු වික්ටෝරියා ශ්‍රී ලංකා සුහ සාධක සංගමයේ ජීවය ගෙන දෙන මහත් ප්‍රබල නිලධාරී මඩුල්ලක් බව මගේ වැටහීමයි. එසේම ඔබ සැමට අභිමානයෙන් යුතු ස්තූති පූර්වක ප්‍රශංසාව ශ්‍රී ලාංකික පියකෙනෙකු ලෙස මම පුද කරමි.









